සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# නර්තනය

6 ශ්‍රේණිය

කාලය පැය 2 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා වූ ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. පා සරඹ නර්තනය කිරීමේදී වාදනය සඳහා භාවිතා කරන්නේ,

(1) ගැට බෙරය පමණි. (2) තාලම් පට පමණි.

(3) උඩැක්කිය පමණි. (4) ලී කෙලිය පමණි.

02. සැම ගොඩ සරඹයක් අවසානයේදීම ඊට අදාලව ........... නර්තනය කරනු ලබයි.

(1) සීරුමාරුව (2) කස්තිරම

(3) අඩව්ව (4) මණ්ඩි පද

03. ''තෛ'' මාසය ලෙස තෛපොංගල් උත්සවයේ දී හඳුන්වනු ලබන්නේ,

(1) අප්‍රේල් (2) මැයි

(3) ජනවාරි (4) මාර්තු

04. පරිසරයේ සුන්දර්තවයෙන් ඇසෙන කුරුලු නාදය වැනි මිහිරි නාදයන් නිසා,

(1) දුක් ඇති වේ. (2) සතුට ඇති වේ.

(3) කනස්සල්ල ඇති වේ . (4) කරුණාව ඇති වේ.

05. ආධුනික නර්තන ශිල්පියෙකු නර්තනය ආරම්භ කිරීමට පෙර කරනු ලබන නමස්කාරයේ දී දෙවන වැඳීම කරනු ලබන්නේ,

(1) බුදුන්ට ය (2) දෙවියන්ට ය

(3) ගුරුවර දෙමාපියන්ට ය (4) දණ්ඩි කඳට හා පොලව මහී කාන්තාවට ය

- **පහත සඳහන් වාක්‍යය හරි නම් (✓) ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

06 ගැමි ජනතාවගේ සිතුම් පැතුම් ඇදහිලි හා විශ්වාස ගැමි නැටුම් නිර්මාණය සඳහා බලපා තිබේ. (      )

07 මාත්‍රා 2 ක් කැටි වීමෙන් සුලු තනි තිත සෑදේ. (      )

08 පා සරඹ නර්තනය කිරීමට තාල තැබීම සඳහා බෙරය යොදා ගනී. (      )

09 තෛපොංගල් උත්සවය හිරු දෙවියන්ට පූජෝපහාර සඳහා පැවැත්වේ. (      )

10 තෙයිකිට තෙයි තාම් මෙය 3 වන පා සරඹයයි. (      )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වරහන් තුල දී ඇති පිළිතුරු වලින් තෝරා හිස් තැනට සුදුසු වචනය ලියන්න.**

(මණ්ඩිය, කෝලම් රටා, ලී කෙළි, පද කියා නර්තනය, කුද ගත ගත දොම්)

11 උඩරට හනුමා වන්නම සඳහා ................ බෙර පදය යොදා ගනී.

12 පා සරඹ පද නර්තනය කිරීමේදී ................ එහි සුවිශේෂ ලක්‍ෂණයකි.

13 සරඹ අභ්‍යාසයේදී නර්තන ශිල්පියා සිටින මූලික ඉරියව්ව ................ නමින් හඳුන්වයි.

14 බෝ අත්තට වැද සිරස නමන්නේ ................ කවියකි.

15 තෛපොංගල් උත්සවයේදී අඳිනු ලබන අලංකාර සිතුවමකි ................

- **A කොටසේ දැක්වෙන වචනයට ගැලපෙන වචනය B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 16 | ඕවාද සිප්පදානේන | නැළවිලි කවි |
| 17 | මතින් උඩගු සිත | පළවෙනි ගොඩ සරඹය |
| 18 | අතට වෙරළු ඇහිද ගෙනේ | ගැමි නැටුම් |
| 19 | තත් ජිත් තොං තං තා | හනුමා වන්නම |
| 20 | සරල බව හා සාමූහික බව | ගුරු නමස්කාරය |

**6 ශ්‍රේණිය** **නර්තනය - II කොටස**

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවැනි (01) ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 (i) නම්‍යතා අභ්‍යාසයෙන් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.

(ii) සංචාරී චලන හා ස්ථිතික චලන වලට උදාහරණ 02 බැගින් ලියන්න.

(iii) නමස්කාර සරඹය ලියා දක්වන්න.

(iv) නමස්කාර සරඹයෙන් කියවෙන අදහස පිළිවෙලින් ලියන්න.

(v) මණ්ඩියේ මූලික ලක්‍ෂණ 02 ක් ලියන්න.

02 (i) ශ්‍රී ලාංකීය ගැමි නැටුම් වල දැකිය හැකි සුවිශේෂ ලක්‍ෂණ 03 ක් ලියන්න.

(ii) කළගෙඩි හා ලී කෙලි නැටුම් දැකිය හැකි අවස්ථා 03 ක් ලියන්න.

(iii) ඔබ දන්නා කළගෙඩි කවියක් හෝ ලී කෙළි කවියක් ලියන්න.

03 (i) නර්තනය ඉගෙන ගන්නා පංති කාමරය තුළදී අනුගමනය කරන චාරිත්‍ර විධි 02 ක් ලියන්න.

(ii) ගුරු වන්දනා ගායනයක් ලියන්න.

04 (i) සුන්දර උද්‍යානයක් නිර්මාණය කිරීමේදී අදාල චරිත ලෙස ගත හැක්කේ මොනවා ද?

(ii) ඔබ අත් විඳි පරිසරයේ අසිරිය පිළිබඳ කවි 02 ක් නිර්මාණය කරන්න.

(iii) පරිසර සුන්දරත්වය දැක්වෙන සිතුවමක් නිර්මාණය කරන්න.

05 (i) තෛපොංගල් උත්සවයේ සැරසිලි සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය මොනවා ද?

(ii) ඔබ කැමති කෝලම් රටාවක් නිර්මාණය කරන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 06 | ✓ | 11 | කුද ගත ගත දොම් | 16 | ගුරු නමස්කාරය |
| 02 | 2 | 07 | ✓ | 12 | පද කියා නර්තනය කිරීම | 17 | හනුමා වන්නම |
| 03 | 3 | 08 | ✗ | 13 | මණ්ඩිය | 18 | නැළවිලි කවි |
| 04 | 2 | 09 | ✓ | 14 | ලී කෙලි කවියකි | 19 | පළවෙනි ගොඩ සරඹය |
| 05 | 2 | 10 | ✗ | 15 | කෝලම් රටා | 20 | ගැමි නැටුම් |

## II කොටස

01 (i) නර්තනයේ දී ශාරීරික අඟ පසඟ නම්‍යශීලීව හා අලංකාරව චලනය කිරීමට හැකි වීම.
සමබරතාව පවත්වා ගනිමින් විවිධ තාල අනුව අංග ප්‍රත්‍යාංග උපාංග හැසිරවීමට හැකිවීම. (ල.02)

(ii)
- සංචාරී චලන :- නිදහසේ පෙරලීම, දිවීම, බඩගෑම
- ස්ථිතික චලන :- එක තැන උඩ පැනීම, ඉන කර කැවීම, ශරීරය හැකිලීම (ල.02)

(iii) නමස්කාර සරඹය ලියා ඇත්නම් (ල.02)

(iv) අදාල පිළිතුර ඇත්නම් (ල.02)

(v)
- නර්තනයේ මූලික ඉරියව්ව වීම.
- විලුඹ දෙක අතර පරතරය මිටි රියනක් වීම.
- පාදවල ඇඟිලි හා දණහිස් දෙක දෙපසට විහිදුවීම. (ල.02)

02 (i) සරල බව, සාමූහික බව, උපකරණ භාවිතය, ගායනා සහිත වීම (ල.03)

(ii) පෙරහැර අවස්ථාවලදී, අවුරුදු උත්සව වලදී, නිදහස් උත්සව වලදී (ල.03)

(iii) අදාල කවි ලියා ඇත්නම් (ල.04)

03 (i)
- පාවහන් ගලවා ඇතුල්වීම.
- නමස්කාර සරඹය කිරීම.
- ගුරුවරයා වන්දනා කිරීම.
- වාද්‍ය භාණ්ඩ වලට වන්දනා කිරීම. (ල.05)

(ii) අදාල කවියක් ලියා ඇත්නම් (ල.05)

04 (i) ඉර, හඳ, ගස්, මල්, වැල් (ල.02)

(ii) සුදුසු ලෙස කවි නිර්මාණය කර ඇත්නම් (ල.04)

(iii) සිතුවමට නගා ඇත්නම් (ල.04)

05 (i) පොල් කුඩු, කැකුළු සහල්, කහ කුඩු, අඹ කොල, කෙසෙල් ගස් ආදී.... (ල.05)

(ii) කෝලම් රටාව නිර්මාණය කර ඇත්නම් (ල.05)